ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2015 මාර්තු 13 |

**ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අදාළ විශේෂ පොලී යෝජනා ක්‍රමය**
**සඳහා වන නව මෙහෙයුම් උපදෙස් මාලාව**

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බැංකුවලට ඉහත සඳහන් යෝජනා ක්‍රමයට අදාළ නව මෙහෙයුම් උපදෙස් මාලාව අද දින නිකුත් කරන ලදී. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- සුදුසුකම් ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්:
  වයස අවුරුදු 60 ට වැඩි සියලුම නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්
- ආවරණය වන තැන්පතු:
  (අ) 2015 ජනවාරි 16 දින සිට වසරක කාලසීමාවක් සඳහා සුදුසුකම්ලත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් තනි තනිව සියලුම බැංකුවල ආරම්භ කරනු ලබන එකතුව රුපියල් මිලියනයකට නොවැඩි ස්ථාවර තැන්පතු.
  (ආ) 2015 ජනවාරි 16 දිනට පෙර සියයට 12 ක විශේෂ පොලී යෝජනා ක්‍රමය යටතේ ආරම්භ කරන ලද එකතුව රුපියල් මිලියන 2.5 කට නොවැඩි ස්ථාවර තැන්පතු.
- ගෙවිය යුතු පොලී අනුපාතය:
  තැන්පතුව ආරම්භ කළ දිනයේ සිට -
  (අ) සියයට 15 ක වාර්ෂික පොලී අනුපාතයක් ඉහත (අ) සඳහා
  (ආ) සියයට 12 ක වාර්ෂික පොලී අනුපාතයක් ඉහත (ආ) සඳහා

ඒ අනුව, මේ සම්බන්ධයෙන් 2015 පෙබරවාරි 25 වන දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අවලංගු කර ඇත.